(12)

**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා**
**චක්‍රලේඛ ලිපි අංක :- 21 / 2025**

මගේ අංකය:- PPSC/ES/07/FI/06/08-5
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා කාර්යාල සංකීර්ණය
නවනගරය, රත්නපුර.
2025.08. 22

සබරගමුව පළාත් සභාවේ
01. ප්‍රධාන ලේකම්
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරී II ශ්‍රේණියේ - II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 සැප්තැම්බර්</u>**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු II ශ්‍රේණියේ අභ්‍යන්තර විගණන නිලධාරීන් ලෙස සේවය කරන නිලධාරීන්ගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ II ශ්‍රේණියේ අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න. අයදුම්කරුවන් ඉදිරිපත් නොවන්නේ නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මා දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි. මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ <u>www.psc.sg.gov.lk</u> හා සබරගමුව පළාත් වෙබ් අඩවියට <u>www.sg.gov.lk</u> යොමු කර ඇත.

02. අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් කරමි.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | විෂය අංකය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | ව්‍යාපෘති සැලසුම්කරණය හා ඒ පිළිබඳ උපාය මාර්ග, ව්‍යාපෘති චක්‍රය, ව්‍යාපෘති වාර්තා සැකසීම හා ඇගයීම් ක්‍රම, ප්‍රගති සමාලෝචනය හා මෙහෙයවීම යන කරුණු සම්බන්ධයෙන් දැනුම පරීක්ෂා කෙරේ. | 01 | පැය 03 | 100 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | රාජ්‍ය මූල්‍ය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව පාර්ලිමේන්තුවේ පාලනය, පළාත් සභාවේ පරිපාලනය ව්‍යුහය හා කාර්යභාරයන් ආදිය සම්බන්ධයෙන් දැනුම පරීක්ෂා කෙරේ. | 02 | පැය 03 | 100 |

සටහන :- **සාමාර්ථය සඳහා එක් එක් විෂයයකට 40 % කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.**

03. **විභාගයට අයදුම්කිරීම** - අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් **2025.09.12** දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට වෙත ලැබෙන සේ යොමු කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. **විභාග ගාස්තු** - පළමු වරට මෙම විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුවෙන් නිදහස් කෙරේ. මීට පෙර මෙම විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී නැවත අයදුම්කරන්නේ නම් රු. 600/- ක් ද එක් විෂයයක් සඳහා නම් රු. 250 /- ක් ද ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශිර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

05. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට විභාගය පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මඟින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

06. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරී II ශ්‍රේණියේ - II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 සැප්තැම්බර්**

01. i. මුලකුරු සමඟ නම : ..........................................................................................................
(සිංහලෙන්)
ii. මුලකුරු සමඟ නම : ..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
iii. මුලකුරු වලින් හැඳින්වෙන නම : ..........................................................................................
(සිංහලෙන්) ..........................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

03. ස්ත්‍රී / පුරුෂ භාවය : ..........................................................................................

04. රාජකාරී ලිපිනය : ..........................................................................................
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ)

05. දුරකථන අංකය : රාජකාරී ...................................... පෞද්ගලික: ..........................................
06. I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය : ..........................................................
07. ඔබ අභ්‍යන්තර විගණන නිලධාරී II ශ්‍රේණියට උසස් වූ දිනය : ..................................................
08. II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටි වාර ගණන : ..................................................

09. ඔබ ඉදිරිපත් වන විෂය/විෂයයන්

| විෂය | විෂය අංකය |
|---|---|
| | |
| | |

10. මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවා ඇති අංක 21 / 2025 දරන සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපියේ සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු අයෙකු නම් එම විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :

(i) ගෙවූ විභාග ගාස්තුව :
(ii) එම මුදල ගෙවනු ලැබූ කාර්යාලයේ නම :
(iii) ඒ සඳහා නිකුත් කළ කුවිතාන්සියේ අංකය හා දිනය :

(විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙම අයදුම්පත්‍රයේ පසුපිට නොගැලවෙන සේ අලවන්න)

11. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය: ................................ ..........................................
අයදුම්කරුගේ අත්සන

---

<u>**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**</u>

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................. මහතා / මහත්මිය / මෙනවිය මෙම කාර්යාලයේ සේවය කරන II ශ්‍රේණියේ අභ්‍යන්තර විගණන නිලධාරියෙකු / නිලධාරිනියක බවත්, අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව හා කාර්යාලයේ ඇති වාර්තා අනුව නිවැරදි බව ද මෙම නිලධාරියා / නිලධාරිනිය කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද නිර්දේශ කරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න)

දිනය: ............................................. ..........................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල නාමය
(කරුණාකර නිලමුද්‍රව තබන්න)